# Trial Monitoring report

**About the case:** වනාතවිල්ලුව ලැක්ටෝවත්තෙහි පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම සබැඳි නඩුව

**Case no. : HC 107/21 (TAB)**

**Courts:** පුත්තලම මහාධිකරණය

**Date of hearing: 2024.06.25**

**Author (s) of report:** මාධව ඊරියගම

**1. Who was in courts:**

| Who | Names / other information | Comments |
|---|---|---|
| **Judge (s)** | විනිසුරු නිශාන්ත හපුආරච්චි මහතා<br>විනිසුරු හසිත සමන් පොන්නම්පෙරුම මහතා<br>විනිසුරු නයෝමි වික්‍රමසේකර | |
| **Attorney General's Dept.** | ජ්‍යෙෂ්ට රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක සහහ රජයේ අධිනීතිඥ ඉසුරි ජයවරධන | |
| **Police (CID / TID etc.)** | **CID Colombo** | |
| **Accused / Suspects** | **1.** අබු හනීෆා මොහොමඩ් මුෆිස් හෙවත් අබු දහිදා<br>**2.** අමීර් හම්සා මොහොමඩ් හමාස් හෙවත් අබු සාෆියා<br>**3.** මොහොමඩ් සරීෆු ආදම් ලෙබ්බේ හෙවත් ගෆූර් මාමා / ගෆූර් නානා හෙවත් අබු හදීද්<br>**4.** මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා හෙවත් සාදික් හෙවත් සාදික් අබ්දුල්ලා හෙවත් අබු උමර්<br>**5.** මොහොම්මදු ඊබ්‍රහිම් මොහොම්මදු නවුෆර් හෙවත් නවුෆර් මවුලවි හෙවත් අබු සෙයිද්<br>**6.** මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිද් හෙවත් සාජිද් මවුලවි හෙවත් අබු නජා | |
| **Lawyers for accused / suspects** | 1,2,4 චූදිතයින් වෙනුවෙන් ශක්මි ෆාරිඩ් මහතා සමඟ නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා.<br>3 වන චූදිත වෙනුවෙන් නීතිඥ ඒ.එච්.එම් අල්තාෆ් මහතා | |

| | | |
|---|---|---|
| | 5 වන චූදිත වෙනුවෙන් රජයෙන් පත්කළ නීතිඥ අද්නාන් ෆසාල් මහතාගේ උපදෙස් මත ඒ.එච්.එම් අල්තාෆ් මහතා<br>6 වන චූදිත වෙනුවෙන් ගසාලි හුසේන් මහතාගේ උපදෙස් මත නීතිඥ ඒ.එච්.එම් අල්තාෆ් මහතා | |
| **Aggrieved party** | - | |
| **Lawyers for aggrieved party** | - | |
| **Supporters of accused / suspects** | | |
| **Supporters of aggrieved party** | - | |
| **Others** | - | |
| | | |

## 2. What happened in court hearing?

("පැමිණිල්ල" යන්නෙන් පැමිණිල්ල වෙනුවෙන් පෙනීසිටි ජෙයෂ්ට රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක මහතා ද "විත්තිය" යන්නෙන් 3 වන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි ඒ.එච්.එම් අල්තාෆ් මහතා ද අරුත් ගැන්වෙන බව සළකන්න)

මෙදින සාක්ෂි විභාගය ආරම්භ කරමින් තුන්වන විත්තිකරු වෙනුවෙන් ගොනුකළ අතිරේඛ සාක්ෂි ලැයිස්තුවේ සාක්ෂි අංක 10 හෙවත් වෛද්‍ය සමින්ද්‍ර රාජපක්ෂ මහතා සාක්ෂියට කැඳවූ අතර ඔහු වයස අවුරුදු 51 වන ගම්පහ ප්‍රදේශයේ පදිංචි දැනට විශේෂඥ අධිකරණ වෛද්‍ය නිළධාරීවරයා ලෙස වතුපිටිවල දිස්ත්‍රික් මූලික රෝහලේ සේවය කරන්නෙකි.

විත්තිය විසින් මූලික ප්‍රශ්න විමසීම ආරම්භ කළ අතර එහි දී විශේෂඥ භාවය හා වෘත්තීය පළපුරුද්ද පිළිබඳ විමසූ ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් වෛද්‍යවරයා එම්.බී.බී.එස් උපාධිය, නීති වෛද්‍ය විද්‍යා උපාධිය, වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය, කැනඩාවේ ටොරොන්ටෝ විශ්ව විද්‍යාලයේ පුහුණුව සහ 2013 සිට අධිකරණ වෛද්‍යවරයෙකු වශයෙන් සේවය කිරීම පිළිබඳ කරුණු දක්වන ලද අතර ඒ අනුව පැමිණිල්ල විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය ප්‍රකාරව එකී වෛද්‍යවරයාගේ සුදුසුකම්, පළපුරුද්ද සහ විශේෂඥ මතය ප්‍රකාශ කිරීමේ හැකියාව විත්තිය විසින් සිදු කළ යෝජනාවක් මත පිළිගත් අතර එය පිළිගැනීමක් ලෙස සටහන් තබන ලදී.

මෙදින මෙම වෛද්‍යවරයාගෙන් මීට පෙර ලකුණු කරන ලද ලේඛනයක් වූ ඔහු විසින්ම සකස් කර අත්සන් තබන ලද 3 වි. 7 ලේඛනය නොහොත් තුන්වන විත්තිකරුට අදාළ අධිකරණ වෛද්‍ය වාරතාව පිළිබඳ ප්‍රශ්න විමසීම ආරම්භ කළ අතර සාක්ෂිකරු විසින් එහි පිටපතක් අධිකරණයට ගෙනැවිත් තිබුණි. එහි මුල් පිටපත පිළිබඳ විමසූ අවස්ථාවේ මුල් පිටපත තමා විසින් අධිකරණය වෙත ලියාපදිංචි තැපැලෙන් යොමු කළ බව වෛද්‍යවරයා විසින් පවසන ලදී. මේ අවස්ථාවේදී 2023.09.04 දින සාක්ෂි මෙහෙයවන අවස්ථාවේදී 3 වන විත්තිකරු වෙනුවෙන් සාක්ෂි මෙහෙයවීමේදී එකී 3 වි. 7 ලේඛනය ලකුනු කළද එහි මුහුණතේ එය සටහන් නොවී තිබීම මත නැවත අදාළ සාක්ෂිකාර වෛද්‍යවරයා වෙත පෙන්වා ලකුණු කිරීමට විත්තිය විසින් ඉල්ලීමක් කළ අතර එයට අධිකරණය විසින් අවසර ලබා දීම මත එකී ලේඛණය

සාක්ෂිකරුට පෙන්වා එම ලේඛණයේ මුද්‍රාව සහ අත්සන තමාගේ බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව නැවත සලකුණු කරන ලදී.

එහිදී විත්තිය විසින් එකී ලේඛනයේ අන්තගර්ත කරුණු තුළින් පරීක්ෂා කරන ලද රෝගියාගේ නම, පරීක්ෂා කරන ලද ස්ථානය, වේලාව සහ පරීක්ෂා කිරීමට ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද යන්න විමසා සිටි අතර ඊට පිළිතුරු දෙමින් තමා විසින් ආදම් ලෙබ්බේ (මෙම නඩුවේ තුන්වන විත්තිකරු) 2020.04.24 වන දින උදෑසන 10 ට පමණ කොළඹ අධිකරණ වෛද්‍ය හා විශවේද ආයතනය තුළදී පරීක්ෂා කල බවත් විත්තිකරු රැගෙන පැමිණියේ ත්‍රස්ත විමශර්න අංශයෙන් බවත් දන්වන ලදී,

රෝගියා විසින් ලබා දෙන කෙටි ඉතිහාසය පිළිබඳව මූලික ප්‍රශ්න යොමු කිරීමේදී ඊට පිළිතුරු දෙමින් සාක්ෂිකරු විසින් රෝගියා තමා අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව විසින් අත් අඩංගුවට ගෙන වසරකට අධික කාලය රඳවා ඇති බවත් එසේ රඳවාගෙන ඇත්තේ පාස්කු ඉරුදින ප්‍රහාරය හා සම්බන්ධව වන බවත් ඔහුට නිළධාරියෙකු විසින් අතින් සහ පයින් 2020.02.27 වන දින පහර දුන් බවත් ඒ හේතුවෙන් ඔහුගේ දකුණු උර පත්තේ කැක්කුමක් සහ මුහුණේ වම් පැත්තේ හිරිවැටීමක් තිබෙන බව ප්‍රකාශ කර ඇති බව අධිකරණය වෙත පවසන ලදී. එසේම එසේ පහර දුන්නේ කවුරුන්ද යන්න තමා නොදන්නා බවත් ප්‍රකාශ කර ඇති බව සාක්ෂිකරු විසින් පවසන ලදී. විශේෂයෙන්ම මෙහිදී චූදිතයින් අතරින් තමන් පරීක්ෂා කරේ කුමන චූදිතද යන්න පිළිබඳ මේ වන විට මතකයක් නොමැති බව විත්තිය විසින් යොමු කළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කරන ලදි.

එහිදී තමන්ට ඔහු හඳුනාගැනීමට උත්සහායක් කළ හැකි දැයි විත්තිය විසින් යොමුකළ ප්‍රශ්නයට පැමිණිල්ල විරුද්ධ වූ අතර මෙම සාක්ෂිකරු විසින් අදාළ රෝගියා පරීක්ෂා කර ඇත්තේ දැනට වසර 4 කට පමන පෙර වන බවත් විශේෂ මතකයක් නොමැති බව පවසා සිටි බවත් ඒ අනුව රෝගියා පරීක්ෂා කර ඇත්තේ මෙම වෛද්‍යවරයා බවට පැමිණිල්ල හබ නොකරන බවත් දන්වා සිටින ලදී. එහිදී මුලින් යොමු කළ ප්‍රශ්නය විත්තිය විසින් ඉල්ලා අස්කරගෙන 3 වන චූදිත සාක්ෂිකරු විසින් පරීක්ෂා කළ බව සහ 3 වි 7 ලේඛනය සාක්ෂිකරු විසින් සාදන ලද ලේඛනයක් බව පැමිණිල්ල පිළිගන්නේ නම් එය අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස සටහන් කළ හැකි බව විත්තිය යෝජනා කළ අතර පැමිණිල්ල එය පිළිගත්තේ ය. ඒ අනුව එය ද පිළිගැනීමක් ලෙස සටහන් තබන ලදී.

ඉන් අනතුරුව රෝගියා පරීක්ෂා කිරීමේදී රෝගියා පිළිදව සාක්ෂිකරු විසින් යොදන ලද සටහන් පිළිබඳව විමසීම සිදු කළ අතර එහිදී රෝගියාගේ අලුත් තුවාල කිසිවක් නොමැති බවත් කැලැල් හතරක් සහ අවපැහැගැන්වීමක් නිරීක්ෂණය වූ බවත් තමන් විසින් අධිකරණ වෛද්‍ය වාරතාවේ ඒ බව සටහන් කර ඇති අතර එම තුවාල 1,2,3,4,5 ලෙස අංකනය කල බව ඔහු විසින් සඳහන් කරන ලදී.

එහි දී අංක 01ලෙස හඳුනා ගන්නා ලද්දේ වම් ඇස ආශ්‍රිත කැලලක් බවත් එහි මැහුම් ලකුණු නොතිබූ බවත් සාක්ෂි කරු විසින් විත්තිය විමසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ප්‍රකාශ කළ අතර එවැනි කැලලක් ඇති විය හැක්කේ කෙසේදැයි විත්තියේ නීතීඥවරයා විමසූ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් පැහැදිලි කිරීමක් ද සිදු කරන ලදී. එහිදී මිනිස් සමේ කොටස් දෙකක් පවතින බවත් එය අපිචමර්ය සහ යටි හම වන බවත් සාමාන්‍යයෙන් කැලලක් නිමර්ාණය වන්නේ යටි සමට හානියක් සිදු වීමෙන් බවත් පැවසූ අතර ඉරීම් සහ කැපීම් වලදී එම කැලැල් නිමර්ාණය වන බව

වැඩිදුරටත් පැවසීය. විත්තිය විසින් කුමන ක්‍රියාවකින් එලෙස කැලැල් ඇති වන්නේද යනුවෙන් ඇසූ ප්‍රශ්නයට මොට ආයුධයකින් සිදු කරන ඉරීමක් හෝ මුවහත් ආයුධයකින් සිදු කරන කැපීමකින් එසේ විය හැකි බවට පිළිතුරු දුන් සාක්ෂි කරු අංක 01 ට අදාළ කැලල අලුත් තුවාලයක් නොවන බැවින් එකී ක්‍රියාවන්ගෙන් කුමන ක්‍රියාවක ප්‍රතිඵලයක්දැයි නිශ්චිතව කිව නොහැකි බව පැවසීය. එසේම විත්තිය විසින් එම කැලල වැටීමක් හෝ පහර දීමකින් සිදු විය හැකි දැයි විමසූ අවස්ථාවේ ඒ ගැන තමන්ට නිශ්චිත මතයක් ප්‍රකාශ කළ නොහැකි බවත් උප්පත්තියෙන්ම හෝ එවැනි කැලලක් ඇති විය හැකි බව ප්‍රකාශ කරන ලදී.

මෙහිදි අංක 03, 04, සහ 05 කැලැල් කුමන ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ඒවා විය හැකි දැයි විත්තිය විසින් යොමු කළ ප්‍රශ්නයට තමාට ලබා දිය හැක්කේ අංක 01 කැලල සම්බන්ධයෙන් දැක්වූ පිළිතුරම බව ප්‍රකාශ කළ සාක්ෂිකරු අංක 03 යනු වම් කලවා ප්‍රදේශයේ කැලලක් බවත්, අංක 04 යනු වම් තට්ටමේ පිහිටි කැලලක් බවත්, අංක 05 යනු දකුනු තට්ටමේ පිහිටි කැලලක් බවත් ප්‍රකාශ කළ අතර මෙම සියලු කැලැල් හමට සිදුවූ හානියක් හෝ තුවාලයකින් පසු ඇති වූ කැලල් බව පවසා සිටින ලදී. එහිදී විත්තිය නැවත කුමන ක්‍රියාවකින් එම කැලැල් සිදු විය හැකි දැයි විමසූ අවස්ථාවේ පිළිතුරු දෙමින් "මොට ආයුධ හෝ කැපුම් නිසා වෙච්ච දෙයක් වෙන්න පුලුවන්. දැඩි උෂ්ණත්වය නිසා පිච්චිලා හමේ යට කොටසට හානි උනොත් කැලලක් එන්න පුලුවන්"පැවසීය.

විත්තිය විසින් ඉන් අනතුරුව අධිකරණ වෛද්‍ය වාරතාවේ මතයන් පිළිබඳව මූලික ප්‍රශ්න විමසීම සිදු කළ අතර එහිදී සාක්ෂිකරුගේ මතයන් 3ක් ලබා දී ඇති බව සාක්ෂිකරු පිළිගන්නා ලදී. ඒ අනුව සාක්ෂිකාරිය විසින්

1. තමා රෝගියා රෝග ඉතිහාසය අනුව අදාළ සිදුවීම සිදු වී මාස 2 කට පමන පසු පරීක්ෂා කළ බව
2. තුවාල හොඳටම සුව වී ඇති බැවින් තුවාල වගරීකරණය කිරීමට හෝ ඒ සඳහා යම් ආයුධයක් භාවිතා කරන ලද්දේ ද එම ආයුධය ගැන මතයක් ප්‍රකාශ කිරීමට හැකියාවක් නොමැති බවත්
3. තුවාල වගරීකරණය කිරීම සඳහා රෝගියා පරීක්ෂා කිරීම/රෝගියාගේ වාරතා පරීක්ෂා කිරීම සිදු කිරීම වැදගත් බව

සිය මතයන් ලෙස ඉදිරිපත් කරන ලද බව ප්‍රකාශ කළ අතර විත්තිය විසින් ඒ අනුව තමාට රෝගියාගේ වාතර්ා කිසිවක් පරීක්ෂා කිරීමට පෙර ලැබුනේ නැතිදැයි විමසූ අවස්ථාවේ එලෙස තමන්ට වෙනත් වාතර්ා කිසිවක් පරිශීලනය සඳහා ඉදිරිපත් නොවූ බව පවසන ලදී. එසේම මෙම තුවාල සුවවීමට කොමපන කලක් ගතවන්නේ දැයි විත්තිය විසින් විමසූ ප්‍රශ්නයට පිලිතුරු දෙමින් සාක්ෂිකරු පවසන ලද්දේ එය තුවාලය පිහිටන ප්‍රදේශය අනුව වෙනස් වන බවත් තුවාලය පිහිටා ඇත්තේ රුධිර සංසරණය හොඳින් සිදුවන ප්‍රදේශයක නම් සති 8 කට පමණ පසු තුවාල සුව වී කැලැල ඇති විය හැකි බවත් සමහර ප්‍රදේශ වල එය මාස 3 හෝ 4 විය හැකි බවත් පවසන ලදි.

ඉන් අනතුරුව විත්තිය විසින් 3 වි 2 නොහොත් තුන්වන චූදිතගේ රෝග විනිශ්වය පත පෙන්වා ප්‍රශ්න ඇසීමට අවසර අධිකරණයෙන් ඉල්ලූ අතර එම ලේඛනය සාක්ෂිකරු විසින් සාදන ලද ලේඛනයක් නොවූවත් ඒ සඳහා අවසර දෙන ලදී. එහිදී සාක්ෂිකරු විසින් එම ලේඛනය කොළඹ ජාතික රෝහලේ හදිසි අනතුරු අංශයෙන් ලබා දුන් ලේඛනයක් බවත් එකී ලේඛනය අනුව එම

ලේඛනයේ සඳහන් රෝගියා 2020.02.27 දින රෝහලට ඇතුලත් කර 2020.02.28 දින රෝහලෙන් මුදාහැර ඇතු බව සටහන් කර ඇති බව ප්‍රකාශ කළ අතර එහි ප්‍රධාන රෝග විනිශ්චය ලෙස Head Injury Observation ලෙස ලියා ඇති බවත් එලෙස සාමාන්‍යයෙන් සටහන් තබන්නේ හදිසි වැටීමක් නිසා ඇති වූ ඔලුවට හානි වීමක් සම්බන්ධයෙන් බවත් ප්‍රකාශ කලේය.

විත්තිය විසින් එම රෝග විනිශ්චිත පතෙහි සඳහන් රෝගියාගේ වම් ඇසෙහි ඇහි බැම්ම ආසන්නයේ වන ඉරීම් තුවාලය සහ ඊට ප්‍රතිකාර ලෙස තුවාලය සුද්ද කිරීම හා මැහුම් දැමීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් විමසූ අතර ඊට පිළිතුරු දෙමින් එය එම රෝග විනිශ්චිත පතෙහි සඳහන් බව සාක්ෂිකරු ප්‍රකාශ කරන ලදී. එසේම එම තුවාලය මීට පසු ඔහු විසින් අධිකරණ වෛද්‍ය වාතර්ව සාදන අවස්ථාවේ ඇස අසල නිරීක්ෂනය කරන ලද මුහුනේ කලු පැහැ අවපැහැගැන්වීම හා සැසඳෙන්නේ දැයි විත්තිය විසින් විමසූ අවස්ථාවේ එය ගැලපීමේ හැකියාවක් ඇති බව ප්‍රකාශ කරන ලදී.

එසේම එම ඉරීම් තුවාලය යකඩ කම්බියක් වැදීමෙන් ඇතිවිය හැකිදැයි විමසූ අවස්ථාවේ එසේ වීමට ද හැකියාවක් ඇති බව සාක්ෂිකරු පවසන ලදී.

මෙහිදී රෝගියා පැය 24ක් වාට්ටුව තුළ තබා ගන්නා ලද්දේ කුමන හේතුවකටදැයි විමසූ ප්‍රශ්නයට සාක්ෂිකරු විසින් පිළිතුරු දෙමින් එම රෝගියාගේ අංක 01 තුවාලය ලෙස රෝග විනිශ්චය පතෙහි සඳහන් තුවාලයට අදාලව ඔහු එලෙස රඳවා ඇති බවත් එලෙස තබා ගන්නේ ඔහුගේ ඔලුව පරීක්ෂා කිරීමෙන්ද නැතහොත් ඇස පරීක්ෂා කිරීමෙන්ද යනුවෙන් ඇසූ ප්‍රශ්නයට පිළිතුරු ලෙස එය පළමු හානිය (ප්‍රමුඛතාව) අනුව තමා සිදු කරන්නේ යනුවෙන් පිළිතුරු ලබා දෙන ලදී. එසේම එම රෝග විනිශ්චිත පත අනුව අදාල තුන්වන චූදිත රෝගියා ස්නායු ශල්‍ය වෛද්‍යවරාට සහ අක්ෂි ශල්‍ය වෛද්‍යවරයාට යොමු කිරීමක්ද සිදු කර ඇති බවත් අක්ෂි සම්බන්ධයෙන් ස්නාලු ශල්‍ය වෛද්‍ය ජෙයෂ්ට ලේඛකාධිකාරි පරික්ෂා කර අක්ෂි භග්න නොමැති බව සඳහන් කර ඇති බවත් සමට හානියක් තිබුනු නිසා හිස්කබලේ ගැටලුවක් ද යන්න පරීක්ෂා කිරීමට එසේ අක්ෂි සම්බන්ධ අංශයකට යොමු කර ඇති බවත් පැවසීය.

ඉන් අනතුරුව 3 වි 4 සහ 3 වි 5 ලේඛන පෙන්වා ප්‍රශ්න ඇසීමට විත්තිය විසින් උත්සහා කළ අතර එකී ලේඛන 3 වන විත්තිකරුගේ ඇස් සම්බන්ධයෙන් වන ලේඛන බැවින් මෙම සාක්ෂිකරුට එය ප්‍රකාශ කළ නොහැකි බවට පැමිණිල්ල විසින් විරෝධතාවයක් ගෙන එන ලදී. එහිදි 3 වි 4 යනු පෙනීම් පරාසය ගැන පිලිබඳ වාතර්‍ාවක් වන බවත් 3 වි 5 යනු ඇස් පෙනීමේ තීව්‍රතාවය පිළිබඳ පරීක්ණයක් බවත් පමණක් සාක්ෂිකරු විසින් පවසන ලදී.

මෙහිදී විත්තිය විසින් මේ අවස්ථාවේ මෙම රෝගියා අධිකරණ ශාලාව තුළ භෞතිකව පරීක්ෂා කර බැලීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලිමක් සිදු කළ අතර එය මෙම අධිකරණයේදී සිදු කළ නොහැකි බවත් සාක්ෂිකරු පැමිණ ඇත්තේ සාක්ෂි ලබා දීමට මිස රෝගීන් පරීක්ෂා කිරීමකට නොවන බව විනිසුරු මඩුල්ල විසින් පවසන ලදී.

එහිදී විත්තිය විසින් පෙන්වා දුන්නේ තුන්වන විත්තිකරු විධිමත්ව රෝහලක වෛද්‍යවරයෙකු වෙත මෙම සිදුවීම සිදුවූ වහාම පෙන්වීමට ඉල්ලීමක් කලද එම වෛද්‍යවරු රෝගියා ස්ඵෂර් කිරීමක් හෝ සිදුනොකරමින් පරීක්ෂා කළ බවයි.

මෙහිදී පැමිණිල්ල වෙනුවෙන් රජයේ අධිනීතිඥ කරුනු දක්වා සිටියේ ඔහුගේ ඇස යට කිසිදු අක්ෂි භග්නයක් නොමැති බවට වාරතාවක් ලබා දී ඇති හෙයින් නැවත ඇස පරීක්ෂා කිරීමට

මෙම ස්ථානයේදී ඉඩ ලබා දිය නොහැකි බවයි. නියමිත කාර්‍යපටිපාටිය අනුගමනය කළ යුතු බව ඔහු විසින් අවධාරණය කරන ලදී.

විත්තියේ මූලික සාක්ෂි විමසීමෙන් අනතුරුව රජයේ අධිනීතිඥවරයා විසින් පැමිණිල්ල වෙනුවෙන් හරස් ප්‍රශ්න විමසන ලද අතර එහිදී වධහිංසනයට ලක්වූ අයෙකු පරික්ෂා කරන්නේ කෙසේදැයි සාක්ෂිකරුගෙන් විමසන ලදී. ඊට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පුද්ගලයා හඳුනාගැනීමෙන් අනතුරුව පුද්ගලිකත්වය ආරක්ෂා කෙරෙන අයුරට පරීක්ෂා කරන බව දන්වා සිටින අතර වධහිංසනයට ලක්කල අයෙක් නම් ඔහු රැගෙන එන නිළධාරීන් පවා ඉවත් කර ඔහුට විශ්වාසය ඇතිවන ආකාරයෙන් එම පරීක්ෂා කිරීම සිදු කරන බව දන්වා සිටින ලදී.

එසේම පහර දීමක් සිදු වූ බව දැනගත්තේ නම් සිදු කරන්නේ කුමක්දැයි සාක්ෂිකරුගෙන් විමසා සිටි අවස්තාවේ ඒ පිලිබඳ අදාළ ආයතන දැනුවත් කරන බවත් පහර දීමක් වූ බව අනාවරණය වන්නේ නම් නැවත රෝගියා එම නිළදාරීන්ට භාර දීම වෙනුවට ඔහු රෝහල් ගත කරන බවත් ඔහු පැවසීය. එසේම එම පහරදීම පිලිබඳව අධිකරණ වෛද්‍ය පර්‍යේෂණ (MLEF) පෝරමයේද සටහන් කරන බව පැවසීය.

විශේෂයෙන්ම වධහිංසාවට භාජනය වූ තැනැත්තන්ට පහර දෙන්නේ කිනම් ස්ථානවලට ද යන්න සාමාන්‍ය ප්‍රශ්නයක් සේ විමසූ අවස්ථාවේ සාක්ෂිකරු විසින් පිටස්තර අයට නොපෙනෙන ස්ථාන වලට එසේ පහර දෙන බවත් විශේෂයෙන් මුහුණට හෝ හිසට වැනි භාහිරට නිරාවරණය වන ස්ථාන වලට පහරදීම සිදු නොකරන බවත් පැවසීය.

එසේම තුවාල කැලැල් වල රටාවක් හඳුනාගත හැකි දැයි විමසූ අවස්ථාවේදී පාවිච්චි කරන ආයුධ අනුව එසේ කිරීමේ හැකියාවක් පවතින බව දන්වා සිටින ලදී.

එසේම 2020.04.29 දින සාක්ෂිකරු තුන්වන විත්තිකාර රෝගියා පරීක්ෂා කලේදැයි විමසූ හරස් ප්‍රශ්නයට පිළිතුරු දෙමින් ඔහු පරීක්ෂා කළ බවත් තුවාල පිළිබඳව නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි බවත් රෝගියාගේ උරහිස රිදීමට විවිධ හේතු බලපෑ හැකි බවත් පවසන ලදී.

සාමාන්‍යයෙන් උරහිස ආශ්‍රිත වේදනාවක් ඇති අයෙකුට කුමන භාහිර නිරීක්ෂනයන් කරන්නේ දැයි විමසූ අවස්ථාවේ උරහිස ඔසවා කරකවා වේදනාවක් ඇතිදැයි බලන බව පවසා සිටි අතර මෙම රෝගියා විසින් රෝග ඉතිහාසයේ පවසන ලද පහරදීම් හඳුනා ගත හැකි කිසිදු වෛද්‍ය සාක්ෂියක් හමු නොවූ බව ද ප්‍රකාශ කරන ලදී. එසේ වුවද එසේ පහරදීම් හඳුනා ගත නොහැකි වීම මතම එම කරුනු ප්‍රතික්ෂේප කළ නොහැකි බව දන්වා සිටින ලදී . මෙහිදී පැමිණිල්ල විසින් සාක්ෂිකරු රෝගියා පරීක්ෂා කිරීමට සතියකට පමණ පෙර වූ දෙයක් පිළිබඳ හඳුනාගත හැකි දැයි විමසූ අවස්ථාවේ භාහිරින් හඳුනාගත නොහැකි වුවත් මානසිකව එසේ තිබුනේ දැයි තමන් නොදන්නා බවත් ප්‍රකාශ කල අතර මානසික වධහිංසනය පිළිබඳ රෝගියා කෙටි ඉතිහාසය තුළ ප්‍රකාශ කලේදැයි විමසූ අවස්ථාවේ සාක්ෂිකරු ඊට නැත ලෙස පිළිතුරු දුන්නේය.

ඉන් අනතුරුව විත්තිය විසින් නැවත ප්‍රශ්න ආරම්භ කළ අතර වදහිංසාව යනුවෙන් තමන් හඳුන්වන්නේ එක පහරදීමක්ද නැතහොත් පහරදීම් කීපයක්ද යනුවෙන් ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් එක පහරදීමක් වුවත් එය ද වධහිංසාවක් වන බවත් මෙම තුන්වන විත්තිකරු සාක්ෂිකරු වෙත ඉදිරිපත් කලේ කවුරුන්ද යන ප්‍රශ්නයට පිළිතුරු දෙමින් පොලිස් පරීක්ෂක මාධව යන අය එසේ ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

මෙහිදි ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල විසින් සාක්ෂිකරු මුදා හරින ලද අතර සාක්ෂි අංක 14 සහ 15 වෙත සිතාසි නිකුත් කර ඇතත් ඔවුන් අධිකරණය වෙත පැමිණ නොමැති බව විත්තිය විසින් දැනුම් දෙන ලදී. එහිදී 15 වන සාක්ෂිකරු යනු තුන්වන විත්තිකරු කොළඹ ජාතික රෝහලේ හදිසි අනතුරු අංශයට ඇතුළත් කළ අවස්ථාවේ ඔහුගේ අක්ෂි පරීක්ෂණයන් සිදු කළ වෛද්‍යා රේණුකා මහානාම යන අය බව අධිකරණයට විත්තිය විසින් පැවසීය. පැමිණිල්ල විසින් එම වෛද්‍යාවරියගේ ලේඛන හබ නොකරන බැවින් ඇය කැඳවීමේ අවශ්‍යතාවක් නොවන බව අධිකරණයට දැනුම් දුන්න ද විත්තිය විසින් ඇය කැඳවා ගැනීම අනිවාර්‍ය බව සඳහන් කරන ලදී. කෙසේ නමුත් ඇය අධිකරණය වෙත පැමිණ නැත.

ඉන් අනතුරුව නැවත සාක්ෂි ලැයිස්තුව පිරික්සීමේදී කෑගල්ල මහාධිකරණයේ රෙජිස්ට්‍රාවර්රයාට සහ මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාවර්රයාට සිතාසි නිකුත්කර ඇති බව ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල අනාවරණය කරගත් අතර එහිදි එම රෙජිස්ට්‍රාර් වරුන් කැඳවීම අවශ්‍ය නොවන බවත් අදාළ නඩු වාරතාව මෙම අධිකරණයට ලැබී ඇති හෙයින් මෙම අධිකරණයේ මුඩලියර් වරිය හරහා එම සාක්ෂි මෙහෙයවිය හැකි බවත් දන්වා සිටින ලදී.

ඒ අනුව අධිකරණ භාෂා පරිවතර්ක තනතුර දරනු ලබන මුඩලියර් වරිය විසින් සාක්ෂි කූඩුවට නැඟ සාක්ෂි ලබා දුන් අතර එහිදී විත්තිය විසින් මූලික ප්‍රශ්න විමසමින් කෑගල්ල මහාධිකරණ නඩු 4485/21 ගොනුවේ පිටපතක් අධිකරණය වෙත ලැබී ඇත්දැයි විමසීය. ඒ අනුව එම ගොනුව අධිකරණය වෙත ලැබී ඇති බවත් එය වෙලුම් තුනකින් සමන්විත බවත් සාක්ෂිකාරිය ප්‍රකාශ කරන ලද අතර එහි එක් වෙලුමක මාවනැල්ල මහේත්‍රාත් අධිකරණ නඩු අංක B 11330/18 ගොනුව ඇතුලත් බවද ප්‍රකාශ කරන අලදී. එසේම එහි කාර්‍ය සටහන් වල 2020/03/02 දින කාර්‍ය සටහන 3 වි. 8 ලෙස ලකුනු කරන ලද අතර එදින අධිකරණය වෙත විත්තිකරුවන් 40 දෙනෙක් ඉදිරිපත් කර ඇති බවත් එහි 19 වන විත්තිකරු මෙම නඩුවේ 3 වන චූදිත බවත් මූලික ප්‍රශ්න වලට පිලිතුරු දෙමින් සාක්ෂිකාරිය ප්‍රකාශ කරන ලදී.

එසේම එහි වෙලුමේ 201 පිටුවේ මහේස්ත්‍රාත්තුමන් විසින් යම් සටහනක් යොදා ඇති බව අනාරවරණය වූ අතර. එම සටහන අපැහැදිලි අත් අකුරු නිසා කියවා ගැනීමට නොහැකි විය. ඒ අනුව ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල එය කියවීමට උත්සහා ගත් අතර ඔවුන් අනාවරණය කර ගත්තේ එය "නාන කාමරේදී වැටී ඇසට තුවාල වූ බව" මහේස්ත්‍රාත්වරයා විසින් සටහන් කර ඇති බවයි.

එහිදි විත්තිය වෙනුවෙන් රුෂ්ඩි හබීබ් මහතා එම මතය පිළිගැනීමට අපහසු බව නැගිට ප්‍රකාශ කල අතර 3 වන විත්තියේ නීතීඥවරයා ද එම කරුණ සම්බන්ධයෙන් එකඟතාවයක් නොවනබව ප්‍රකාශ කරන ලදී. මෙහිදි මොහොමඩ් ෆසිල් යන අය විසින් හරස් ප්‍රශ්න විමසීමේදී ලබා දුන් පිළිතුරු ඇතුලත් 39 වන පිටුවේ 3-13 ඡේද සහ 46 පිටුවේ 12 – 17 ඡේද පිළිගැනීමක් ලෙස ලකුණු කිරීමට අධිකරණය විසින් අවසර ලබා දෙන ලදී.

මෙහිදි අදාළ සාක්ෂිකාරියගෙන් පැමිණිල්ල විසින් හරස් ප්‍රශ්න විමසමින් "නාන කාමරේදී වැටී ඇසර තුවාල වූ බව" නඩු වාතර්ාවේ සඳහන් වන්නේදැයි විමසූ අතර එයට ඇය ඔව් ලෙස පිළිතුරු ලබා දෙන ලදී. එහිදී විත්තිය වෙනුවෙන් නැවත ප්‍රශ්න අසමින් එම ප්‍රකාශය අපැහැදිලි කියවාගත නොහැකි ප්‍රකාශයක් ද යන්න විමසන ලද අතර එයටද සාක්ෂි කාරිය ඔව් යනුවෙන් පිළිතුරු ලබා දුන්නේය.

ඉන් අනතුරුව අධිකරණය විසින් මෙම ප්‍රකාශය නිවැරදිව කියවා ගැනීමට කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාවර්රයා කැඳවා ගැනීමට අවස්ථාව ලබා දුන් අතර මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර් කැඳවාගැනීම අවශ්‍ය නොවන බව දන්වන ලදී. විත්තිය එම මතය පිලිගන්නා ලදී.

නඩු විභාගය පසු දිනට කල් තබන ලදී.

3. **Any significant observations inside court room and outside?** නැත

**4. Next date & time: 2024.07.16 / 2024.07.17**